**ටවර් හෝල් රඟහල පදනම - 2016**

---------------------------------------------

ටවර් හෝල් රඟහල පදනමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනතේ 12 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2018 ජනවාරි 22 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ටවර් හෝල් රඟහල පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

### (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති ආයෝජන පොලී ලැබීම් තුල එකතුව රු.333,607 ක්වූ සේවක ණය පොලී හා ඉතිරි කිරීමේ ගිණුම සඳහා වූ පොලී ලැබීම් ඇතුලත් කර තිබුණි.

### (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3

ඉකුත් වර්ෂවල දෝෂ නිවැරදි කිරීම සඳහා අතීතානුයෝගීව ගැලපිය යුතු රු.30,558,512 සමාලෝචිත වර්ෂය තුලදී ගැලපීම හේතුවෙන් සංසන්දනාත්මක සංඛ්‍යාවලට සිදු වූ බලපෑම මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය නොවීය.

### (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

(i) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන අගයට ප්‍රකාශ කර ඇතිවිට ඒ පිළිබඳව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකළ යුතු නමුත් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයෙහි ප්‍රත්‍යාගණන අතිරික්තය ලෙස දක්වා තිබූ රු.681,030,453 කට අදාළ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ගිණුම් සටහන්වලින් ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය, වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 8,992,531 ක්වූ වාහන 05 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ක්ෂය අනුපාත ඇස්තමේන්තුගත කිරීමේදී වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**
----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස පිළිවෙලින් රු.102,000,000 ක් සහ රු.4,380,000 ක් ලැබී තිබුණද එම ප්‍රදාන රු.89,280,000 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.17,100,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පදනම සතු ගොඩනැගිල්ල 2007 වර්ෂයේදී රු.මිලියන 200කට තක්සේරු කර තිබුණද 2016 දෙසැම්බර් 31 දින දක්වාම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති රු.14,408,658 ක් වූ ආයෝජන පොළී ලැබීම් තුළ රු.333,607 ක ආයෝජන ක්‍රියාකාරකමක් නොවූ සේවක ණය පොළීද ඇතුළත් කර තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආයෝජන පොලී රු.135,570 ක් අඩුවෙන් දක්වා තිබීම නිසා වර්ෂයේ ලැබිය යුතු ශේෂ සහ ආයෝජන පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**
----------------------------------

පදනම විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ලේඛන අනුව වර්ෂය තුල මුදලින් ලද ආයෝජන පොලී වටිනාකම රු.13,418,665 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු.14,046,602 ක් වූයෙන් රු.627,937 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වෙනත් ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් වර්ෂ ගණනාවක සිට පැවත එන එකතු වටිනාකම රු.220,479 ක් වූ ශේෂ 2017 නොවැම්බර් 30 දින දක්වා අයකර ගැනීමට පදනම විසින් අපොහොසත් වී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 2,015,119 ක් වූ ණයගිමි ශේෂය 2017 නොවැම්බර් 30 දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මෙම ණය ශේෂ තුළ අවුරුදු 5ට වැඩි ශේෂවල වටිනාකම රු.1,639,113 ක් විය.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**
--------------------------------------------------------------------------

පහත සඳහන් නීතිරීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 (2) | රඟහල් වෙන්කිරීමේදී අයකරගන්නා තැන්පතු වලින් සමන්විත වර්ෂ 2කට පෙර සිට පැවත එන ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ශේෂය තුළ ඇතුළත් රුක්මනී දේවී අනුස්මරණ කේන්ද්‍රයට අදාළ රු.84,000 ක තැන්පතු හා ටවර්හෝල් රඟහලට අදාළ රු.252,000ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ පදනම විසින් ක්‍රියාත්මක කළ "මනමේ සහ රේඛාව" විශේෂ ව්‍යාපෘතිය සඳහා සහ "මනමේ අභිමංගල දැක්ම" සඳහා ලිපිකවර, ආරාධනා පත්‍ර, වාහන අවසර පත්‍ර, හැඳුනුම්පත් සහ ග්‍රන්ථ ආවරණ, ඩිජිටල් පුවරු ආදිය මුද්‍රණය කිරීමට එකතුව රු.875,666 ක් වැයකර තිබුණි. අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත පෞද්ගලික මුද්‍රණ ආයතනයකින් එම සේවාවන් සපයා ගෙන තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සිදුකළ යුතු මිල කැඳවීම් කිසිවක් සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මෙහෙයුම් කටයුතුවලින් රු. 17,552,384 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,050,421 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.5,501,963 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොලී හා බදු කුලී ආදායම රු.3,392,644කින් අඩු වීම සහ පරිපාලන හා ආයතන වියදම් රු.1,783,533කින් හා ප්‍රවර්ධන හා සුභසාධන වියදම් රු.4,819,563කින් වැඩිවීම මෙම ඌනතාවය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ඌනතාවයක් ඇතිවී තිබුණි. එහෙත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් නැවත ගැළපීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පිළිවෙලින් රු. 29,169,075 ක, රු. 28,695,875 ක, රු. 26,376,128 ක, රු. 31,686,747 ක හා රු.32,104,972 ක දායකත්වයක් පෙන්නුම් කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1978 අංක 01 දරන ටවර්හෝල් රඟහල පදනම පනත අනුව ජාතික නෘත්‍ය කටයුතු දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම, රඟහල පිළිබඳ දැනුම, අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම, රඟහල් නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහාය වීම, ගීත නාට්‍ය, නැටුම් නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීම හා ඒ පිළිබඳ පරීක්ෂණ කිරීම සහ ඒවා රඟ දැක්වීමේ නියුක්ත වීම, මණ්ඩලය සුදුසු යැයි සලකන කාර්යයන් සඳහා

ටවර්හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම, ආරක්ෂා කිරීම, පවත්වාගෙන යෑම සහ ප්‍රයෝජනයට ගැනීම පදනමේ ප්‍රධාන පරමාර්ථ විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, ඉටු කිරීමට සැලසුම්කළ වැඩසටහන් / ව්‍යාපෘති 34 කින් ඇස්තමේන්තුගත පිරිවැය රු.5,800,000 ක් වූ වැඩසටහන් / ව්‍යාපෘති 15 ක් ඉටුකර නොතිබුණි. තවද ක්‍රියාත්මක කළ වැඩසටහන් / ව්‍යාපෘති 05 ක භෞතික ප්‍රගතිය සැලකීමේදී එය සියයට 25 සිට සියයට 50 දක්වා අවම මට්ටමක පැවතුණි.

(ආ) පදනම විසින් පවත්වාගෙන යනු ලබන ටවර් හා රංග කලා පාසල විසින් දෙවර්ෂ පූර්ණ කාලීන නාට්‍ය හා රංගන කලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යනු ලබන අතර පාඨමාලාවේ සිසුන් සංඛ්‍යාව හා පාඨමාලා ගාස්තු වාර්ෂිකව වැඩිකර තිබුණි. ඒ අනුව 2012 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ සිසුන් සංඛ්‍යාව 23 සිට 40 දක්වාද පාඨමාලා ගාස්තුව රු.50,000 සිට රු.85,000 දක්වාද වැඩිකර තිබුණි. නමුත් සිසුනට අවශ්‍ය දේශන ශාලා පහසුකම්, පුස්තකාල පහසුකම්, ප්‍රායෝගික අභ්‍යාස ශාලා පහසුකම්, සනීපාරක්ෂක සේවා පහසුකම්, පරිගණක පහසුකම්, සැරසුම් කාමර පහසුකම්, විවේකාගාර පහසුකම්, නේවාසිකාගාර පහසුකම් හා ආපනශාලා පහසුකම් යනාදිය ප්‍රමාණවත් අයුරින් සම්පූර්ණ කර නොතිබුණි. ඒ අනුව පනතේ අරමුණු කරා ළඟාවීමට හැකිවන සේ ටවර් නාට්‍ය හා රංගන කලා පාසල කඩිනමින් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාසංගික කලාකරුවන්ට ආධාර සැපයීම සඳහා වන ටවර්හෝල් රඟහල පදනමට අයත් ජනාධිපති සුභසාධන අරමුදලේ පාලනය සඳහා ටවර්හෝල් රඟහල පදනමේ භාරකාර මණ්ඩලයට වගකිව යුතු, කළමනාකරණ මණ්ඩලයක් පත් කර තිබුණද 2011 අගෝස්තු 29 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එම මණ්ඩලය රැස්වී නොතිබුණු අතර ඒ අනුව සුභසාධන අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් තීරණ කිසිවක් ගෙන නොතිබුණි.

(ආ) රුක්මනී දේවි රඟහලේ නිත්‍ය කළමනාකරු එම තනතුරෙහි රාජකාරි කටයුතු නොවන, "මනමේ හා රේඛාව" විශේෂ ව්‍යාපෘතියෙහි රාජකාරි කටයුතු සඳහා යොදවා රඟහල් කළමනාකරු තනතුරේ වැඩ බැලීම සඳහා වෙනත් නිලධාරියෙකු යොදවා තිබීම හේතුවෙන් පදනම රු.48,835 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

(ඇ) "මනමේ සහ රේඛාව" විශේෂ ව්‍යාපෘතිය සඳහා පදනම විසින් දුරකථන බිල්, සම්බන්ධීකරණ නිලධාරී වැටුප් , ලිපිද්‍රව්‍ය, මුද්‍රණ වියදම්, සංග්‍රහ වියදම්, ශබ්ද උපකරණ කුලියට ගැනීම හා වෙනත් වියදම් ලෙස 2016 ඔක්තෝබර් 30 දින වන විට රු.2,035,471 ක් වැය කර තිබුණි. මෙම වියදම් 2016 වර්ෂයේ අයවැය හා ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත්ව නොතිබුණු අතර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත පමණක් සිදුකර තිබුණි.

(ඈ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පදනම වෙත ලබාදී තිබූ "උතුරු නැගෙනහිර වාරිමාර්ග හා කෘෂිකාර්මික ව්‍යාපෘතිය" ට අයත් වාහනයක් 2015 නොවැම්බර් මාසයේ සිට පදනමේ රාජකාරි කටයුතු සඳහා යොදවා තිබුණු අතර එය විධිමත්ව පදනම වෙත පවරා ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ඉ) පදනමේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන දෙමහල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 32000 ක පමණ ප්‍රමාණයක් වූ එක් මහලක් ගිවිසුමකට එළඹීමකින් තොරව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට 2016 මැයි 16 දින සිට භාවිතා කිරීමට ලබාදී තිබුණි. 2017 නොවැම්බර් 30 දින දක්වාම ගොඩනැගිල්ල භාවිතා කිරීම වෙනුවෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙතින් කුලී අයකර ගෙන නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනමේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට නිලධාරියකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට 2015 ජනවාරි 21 දින පුවත්පත් 05 ක ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම වෙනුවෙන් රු. 163,736 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, එම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමකින් තොරව, 2015 ජූලි 02 දින පාලක මණ්ඩල සභාපතිවරයා විසින් ඊට පරිබාහිරව හා බඳවාගැනීම් පටිපාටියේ 4.2 උප ඡේදයට පටහැනිව අවුරුදු 60 ඉක්මවූ පුද්ගලයෙකු ස්ථිර පදනම මත බඳවාගෙන එම නිලධාරියා වෙත 2015 ජූලි 02 දින සිට 2016 ඔක්තෝබර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු.1,361,320 ක් ගෙවා තිබුණි.

(ආ) පදනම විසින් පවත්වනු ලබන සාමාන්‍ය අවුරුදු උත්සවයට අමතරව, 2016 අප්‍රේල් 26 දින කලාකරු හා සේවක මණ්ඩලයේ අවුරුදු උත්සවය නමින් උත්සවයක් පැවැත්වීම සඳහා සංග්‍රහ වියදම් රු.306,000 ක්, ප්‍රචාරක පුවරු සඳහා රු. 246,000 ක් සහ වීදි නාට්‍යයකට අවශ්‍ය ද්‍රව්‍ය මිලටගැනීම සඳහා රු.48,000 ක්ද වශයෙන් රු.600,000 ක් පදනම විසින් වැය කර තිබුණි. එම මුදල් කලාකරු සුභ සාධනය සහ වෙනත් වැඩසටහන් රාශියක් සඳහා 2016 අප්‍රේල් 29 දින මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලබාගත් රු.600,000 ක මුදලින් ආවරණය කරගෙන තිබුණි. එසේ වුවද 2016 අප්‍රේල් 26 දින පදනමේ සේවක මණ්ඩලය තම තමන් රාජකාරී කරනු ලබන ප්‍රධාන කාර්යාලය, ටවර්හෝල් රඟහල, එල්ෆින්ස්ටන් රඟහල සහ රුක්මණී දේවී රඟහල ආදී ස්ථාන වල රාජකාරී සඳහා වාර්තා කර තිබූ බව පැමිණීමේ ලේඛන අනුව තහවුරු වූ අතර එදින එවැනි අවුරුදු උත්සවයක් පවත්වා තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.4 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

2012 වර්ෂයේ ආරම්භකර තිබූ එල්ෆින්ස්ටන් රඟහල නවීකරණ කටයුතු 2017 දෙසැම්බර් 31 දින වනවිටද නිම කර නොතිබුණද 2014 ජූනි 18 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව රඟහලේ ප්‍රයෝජනය සඳහා ආසන 700ක් පෞද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. ආසන සවි කිරීමෙන් පසු නිසි ප්‍රමිතියකින් යුක්තද යන්න තහවුරු කරගැනීමකින් තොරව මුළු වටිනාකම වූ රු.12,768,000 කින් රු.9,019,794 ක් 2015 ඔක්තෝබර් 28 දින වනවිට ගෙවා තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වනවිටත් එම ආසන ප්‍රයෝජනයට නොගෙන රඟහල තුළ ගොඩගසා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩලය 2016 දෙසැම්බර් 31 දිනට 91 ක් වුවද එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 64 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 27 ක් විය. එම පුරප්පාඩු අතර අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ පාලන හා සංවර්ධන, අභ්‍යන්තර විගණක, පාඨමාලා සම්බන්ධීකරණ නිලධාරී, ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක, රුක්මණීදේවී රඟහල් කළමනාකරු හා එල්ෆින්ස්ටන් රඟහල් කළමනාකරු යන තනතුරු පුරප්පාඩු වීම නිසා එම අංශවල ක්‍රියාකාරිත්වය දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) පදනමේ අනුමත තනතුරක් වූ අධ්‍යක්ෂ පාලන හා සංවර්ධන තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවාගැනීමට කටයුතු නොකර වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම

මත අවුරුදු 60 ඉක්මවූ පුද්ගලයකු 2015 නොවැම්බර් 02 දින බඳවාගෙන නැවතත් එම කොන්ත්‍රාත් කාලය වසරක් දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද පදනම විසින් 2015 නොවැම්බර් 02 දින සිට 2016 ඔක්තෝබර් 30 දින දක්වා කාලපරිච්ඡේදය තුළ එම නිලධාරියාට වැටුප් ලෙස රු.449,242 ක් ගෙවා තිබුණි.

(ඇ) පදනමේ අභ්‍යන්තර විගණක තනතුර පිරවීම සඳහා 2011 ජූලි 20 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණද, 2017 නොවැම්බර් 30 දින වන විටද එම තනතුර පුරප්පාඩුව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 උප වගන්තිය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 4 දින 10ක ප්‍රමාදයකින් පසුව 2017 ජූලි 10 දිනදීය.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

-------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.2 උප වගන්තිය ප්‍රකාරව එක් එක් අරමුණු ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ඉලක්කයන් ද එම ඉලක්කයන් සඳහා වගකිව යුතු නිලධාරීන් ද සඳහන් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවද පදනම විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම එයට අනුකූල නොවූ බව නිරීක්ෂණය විය.

**5.3 විගණන කමිටු**

--------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සෑම කාර්තුවකටම වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද 2016 ජනවාරි සිට 2017 නොවැම්බර් 30 දක්වාම පදනම විසින් කිසිදු විගණන කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

2015 ජූලි 29 දිනැති අංක 3/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නිසි පරිදි අයවැය ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දී රු.8,577,000 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**5.5 අභ්‍යන්තර විගණනය**

-------------------------

මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධානයන් අනුව පදනමේ අභ්‍යන්තර පාලනය හා අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ පරීක්ෂාවන් පවත්වාගෙන යෑම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතුවුවත්, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර අභ්‍යන්තර විගණනයක් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින්වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ප්‍රාග්ධන ප්‍රදාන, ආයෝජන පොළී ලැබීම් නිවැරදිව ගිණුම් ගත නොකිරීම. |
| | (ii) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල නොකිරීම. |
| | (iii) | ඇතැම් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම. |
| | (iv) | ජංගම නොවන වත්කම් ගිණුම්ගත නොකිරීම හා ක්ෂය නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | පුරප්පාඩු පිරවීම සඳහා ස්ථිර නිළධාරීන් බඳවා නොගැනීම. |
| | (ii) | දීර්ඝ කාලයක සිට ඇතැම් තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් සේවයේ යොදවා තිබීම. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල නොවීම. |
| | (ii) | ඉදිකිරීමේ කොන්ත්‍රාත් අදාළ කාලය තුළ නිමකිරීමට අපොහොසත් වීම. |
| | (iii) | ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා පැවතීම. |